සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය

# ක්‍රිස්තු ධර්මය

කාලය පැය 02 යි

නම/ විභාග අංකයඃ

## I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1- 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. දෙවියන් වහන්සේ ලෝකය මැවූ අකාරය සඳහන් වන ග්‍රන්ථය වන්නේ,

(1) උත්පත්ති ය. (2) නික්මයාම ය.
(3) ගීතාවලිය ය. (4) ශුද්ධ ලූක් ය.

02. "................. තම ස්වරූපය අනුව මිනිසා මැවූ සේක. " මෙහි හිස්තැනට උචිත වදන වන්නේ,

(1) දෙවියන් වහන්සේ ය. (2) ජේසුස් වහන්සේ ය.
(3) ශුද්ධාත්මයාණන් වහන්සේ ය. (4) පරමෝත්තමයාණන් වහන්සේ ය.

03. දෙවියන් වහන්සේ විසින් අපට රාත්‍රිය ලබා දුන්නේ,

(1) වැඩ කිරීමටය. (2) සංචාරය කිරීමටය.
(3) ආහාර ගැනීමටය. (4) විවේක ගැනීමටය.

04. දෙවියන් වහන්සේ දේව මැවිල්ල නිම කොට එය භාර දුන්නේ,

(1) සිවුපාවුන්ටය. (2) පක්ෂීන්ටය.
(3) මිනිසාටය. (4) අභ්‍යවකාශයටය.

05. කිතු උපත මුලින්ම දැනුම් දෙනු ලැබුයේ,

(1) රජවරුන්ට ය. (2) එඬේරුන්ට ය.
(3) සාමාන්‍ය ජනයාට ය. (4) පරිසිවරුන්ට ය.

06. ජේසුස් වහන්සේ........... හා ............. ද දෙවියන් වහන්සේගේ හා මිනිසුන්ගේ ප්‍රසාදය ලබමින් වැඩුණු සේක.

(1) බුද්ධියෙන් හා හැඩරුවින්ය. (2) කාය ශක්තියෙන් හා ප්‍රඥාවෙන්ය.
(3) ප්‍රඥා මහිමයෙන් හා කාය ශක්තියෙන්ය. (4) බුද්දියෙන් හා ප්‍රඥාවෙන්ය.

07. දෙවියන් වහන්සේ හඳුනන දරුවෙකු ලෙස ඔබ සතුන්ට,

(1) කරුණාව දැක්විය යුතුය.
(2) ආරක්ෂාව සඳහා කුඩු සාදා දිය යුතුය.
(3) හිංසා පීඩා කළ යුතුය.
(4) ඔවුන්ගේ දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගත යුතුය.

08. අති උසස් තැන්හි දෙවිඳුන්ට මහිමයද මිහිපිට ප්‍රසාද ලත් ජනයා අතර සාමය ද වේවා! ලෙස ප්‍රශංසා ගී ගැයුවේ,

(1) ජනතාවය. (2) ගෝලයන්ටය.

(3) දේවදූතයන්ටය. (4) රජවරුන්ටය.

09. කිතුණු අපට සුවිශේෂිම උපත වන්නේ

(1) මරියතුමියගේ උපතයි. (2) ජේසුස් වහන්සේගේ උපතයි.

(3) ස්නාවක ජොහාන්ගේ උපතයි. (4) මෝසෙස්ගේ උපතයි.

10. ඔබේ පන්ති කාමරයේ මිතුරන් දෙදෙනෙකු රණ්ඩු කරන්නේ නම් ඔබ කළ යුත්තේ,

(1) තම මිතුරාගේ පැත්ත ගැනීමයි. (2) සාමකාමීව ගැටලුව විසඳාගැනීමට උදව් වීමයි.

(3) නොදුටුවා සේ සිටීමයි. (4) එකිනෙකා අතර මතභේදය වර්ධනය කිරීමයි.

- **අංක 11 - 15 දක්වා ප්‍රකාශ නිවැරදිව යා කර දක්වන්න.**

| | |
|---|---|
| 11. ජේසුස් වහන්සේ ඇණ ගසනු ලැබූ ස්ථානය වන්නේ | දෙවියන් වහන්සේය. |
| 12. දේව මාලිගය පිහිටා ඇත්තේ | ගාබ්‍රියෙල් දේවදූතයා |
| 13. මෙම සුන්දර පරිසරය අපට ලබා දුන්නේ | ගොල්ගොතාවේ ය. |
| 14. ජේසුස් වහන්සේට "ජේසුස්" යන නාමය තැබිය යුතු බව ප්‍රකාශ කළේ | ජේසුස් වහන්සේය. |
| 15. අප වෙනුවෙන් තම ජීවිතය පූජා කළේ | ජෙරුසලමේය. |

- **අංක 16 - 20 දක්වා ප්‍රකාශ හරි නම් (✓) ලකුණද, වැරදි නම් (X) ලකුණද යොදන්න.**

16. දෙවියන් වහන්සේ සත්වන දවසට ආසිරි පතා ශුද්ධ දිනයක් ලෙස නම් කෙරිණි. (..........)

17. සුබ ආරංචි ගෙනෙන දූතයා ලෙස ශුද්ධ බයිබලය පෙන්වා දෙන්නේ මිකායෙල් දේව දූතයාය. (..........)

18. ජුදෙව් ව්‍යවස්ථාව අනුව අවුරුදු 12 පිරිමි දරුවෙකු වැඩිහිටියෙකු ලෙස පිළිගැනිණි. (..........)

19. ජේසුස් වහන්සේට කුරුසිය රැගෙන යෑමට උදව් වූයේ කිරේනියේ සීමොන්ය. (..........)

20. ක්‍රිස්තුස් වහන්සේ මරණය පරදා ජය ලැබුවේ මහ සිකුරාදා දිනයේය. (..........)

- **පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. ප්‍රශ්න සියල්ලට ම කෙටි පිළිතුරු සපයන්න.

(1) දෙවියන් වහන්සේ මිනිසාව නිර්මාණය කළේ කීවෙනි දිනයේදී ද?

(2) දේව මැවිල්ලේ ප්‍රධාන අංගයක් වන ශාක වලින් අපට ලැබෙන ප්‍රයෝජන 2 ක් ලියන්න.

(3) දෙවියන් වහන්සේ විසින් මවන ලද මුල්ම මිනිසා හා ස්ත්‍රීය නම් කරන්න.

(4) ජුදෙව් පාස්කු මංගල්‍යය යනු කුමක්ද?

(5) කුරුසිපත් කළ ජේසුස් වහන්සේගේ ඉසට ඉහළින් රඳවා තිබූ පුවරුවේ සඳහන් වාක්‍ය ලියන්න.

(6) ජේසුස් වහන්සේ දිවි පුදන අවස්ථාවේ 'ඒලි ඒලි ලාමා සබක්තානි' ලෙස කළ ප්‍රකාශයේ අර්ථය කුමක්ද?

(7) වයස අවුරුදු 12 ක ජුදෙව් පිරිමි දරුවෙකු ලබන වරප්‍රසාද 2 ක් ලියන්න.

(8) ඔබේ පන්ති කාමරයේ ඉගෙනීමට දුර්වල මිතුරෙකුට ඔබට කළ හැකි උපකාර 2 ක් ලියන්න.

(ල. 2x8=16)

02. ඉර සඳ හා තරුවැල් මවලා - ගහකොළ හා සියොතුන් මවලා
ඇල දොල ගංගා සුදු පෙණ නංගා - ලස්සන මේ ලෝකය නිමවා

(1) ඉහත සඳහන් ගීතයේ දෙවියන් වහන්සේ විසින් ලෝකය ලස්සන කිරීමට එක් කළ දේවල් 04 ක් නම් කරන්න. (ල. 02)

(2) මිනිසා විසින් හිතාමතා පරිසරය විනාශ කරන අවස්ථා 3 ක් ලියන්න. (ල. 03)

(3) දෙවියන් වහන්සේ අපට දුන් මේ පරිසරය ආරක්ෂා කරගැනීමට ඔබ කරන යෝජනා 6 ක් ලියන්න. (ල. 06)

03. (1) ජේසු කුමරු බැලීමට පැමිණි ශාස්ත්‍රවන්තයින් රැගෙන ආ දේවල් 2 ක් ලියන්න. (ල. 02)

(2) ජේසු කුමරු හඳුනා ගැනීමට එඬේරුන්ට දුන් සලකුණ කුමක්ද? (ල. 03)

(3) කිතු උපත සමරන 'නත්තල තුළ අපට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න. (ල. 06)

04. (1) ජේසු කුමරු අවුරුදු 12 දී ජෙරුසලමට යෑමට හේතුව කුමක්ද? (ල. 02)

(2) දෙමාපියන් නැවත නිවසට යෑමට කතා කිරීමේදී ජේසුස් වහන්සේ දුන් පිළිතුර කුමක්ද? (ල. 03)

(3) ජේසු කුමරු තම දෙමව්පියන්ට උදව් වූවා සේ අපට ද අපේ දෙමාපියන්ට කළ හැකි උදව් 6 ක් ලියන්න. (ල. 06)

05. (1) ජේසුස් වහන්සේ කුරුසපත් කිරීමෙන් පසු සබත් දිනයේ කාන්තාවන් සොහොන වෙත ගියේ ඇයි? (ල. 02)

(2) සොහොන වෙත ගිය කාන්තාවන්ට ජේසුස් වහන්සේ ගැන ලද සුපුවත කුමක්ද? (ල. 03)

(3) අපට කිතුනු සුභාරංචිය සමාජයට ගෙන යෑමට කළ හැකි දේවල් 3 ක් ලියන්න. (ල. 06)

06. (1) ජේසුස් වහන්සේ කුරුසියේ තම ජීවිතය පූජා කළේ ඇයි? (ල. 02)

(2) ක්‍රිස්තුස් වහන්සේ කුරුසිපත් කිරීමට පෙර උන්වහන්සේට දුන් තාඩන පීඩන 3 ක් ලියන්න. (ල. 03)

(3) අපේ පව් උදෙසා කමාව යදිමින් කෙටි යාච්ඤාවක් ලියන්න. (ල. 06)

| 6 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය 2018 | ක්‍රිස්තු ධර්මය |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

01. ( 1 ) 02. ( 1 ) 03. ( 4 ) 04. ( 3 ) 05. ( 2 ) 06. ( 3 ) 07. ( 1 ) 08. ( 3 ) 09. ( 2 ) 10. ( 2 )

11. ගොල්ගොතාවේය. 12. ජෙරුසලමේය. 13. දෙවියන් වහන්සේය. 14. ගාබ්‍රියෙල් දේවදූතයාය.
15. ජේසුස් වහන්සේය. 06. (✓) 17. ( x ) 18. (✓) 19. (✓) 20. ( x )

## II කොටස

01. (1) හයවන දිනයේ ය.
    (2) ආහාර, වාතය, ඖෂධ, ගෘහභාණ්ඩ......... වැනි පිළිතුරු සඳහා
    (3) ආදම් සහ ඒව
    (4) දෙවියන් වහන්සේ මෝසෙස් මගින් පොරොන්දු දේශය කරා රැගෙන යෑමේ සිද්ධිය.
    (5) 'මොහු ජුදෙව්වන්ගේ රජ ජේසුස් ය.'
    (6) මාගේ දෙවියනි, මාගේ දෙවියනී, ඔබ මා අත්හැරියේ මන්ද?
    (7) වැඩිහිටියෙකු ලෙස පිළිගැනීම.
    දේව මාලිගාවේ නමස්කාරයට හා අධ්‍යාපනය ලැබීමට හැකි වීම.
    දේව මාලිගාවේ පැවැත්වෙන මංගල්‍යයන්ට සහභාගි වීමට.
    (8) පසුගිය අභ්‍යාස වල පිළිතුරු කියා දීම.
    නොදන්නා විෂය කරුණු සාකච්ඡා කිරීම......... වැනි පිළිතුරු (ල. 2x8=16)

02. (1) ඉර, සඳ, තරු, ගහකොළ, සියොතුන්.........
    (2) ගස් කැපීම, වනාන්තර විනාශ කිරීම, පොලිතින් භාවිතය, ජලයට කෘෂි රසායන එක්කිරීම....... වැනි පිළිතුරු
    (3) ගස් වැල් සෑදීම, පොලිතින් භාවිතය අවම කිරීම ........ වැනි පිළිතුරු

03. (1) රත්රන්, තුවරලා, ගන්ධරස
    (2) රෙදි වලින් ඔතා ගවයින් කන ඔරුවක බාවා සිටින බිළිඳෙකු
    (3) අසරණයන්ට පිහිට වීම, ආහාර පාන, ඇඳුම් පැළඳුම් බෙදා ගැනීම, රෝගීන්ට පිහිට වීම, ඔවුන් බැහැදැකීමට යෑම....... වැනි පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

04. (1) පාස්කු මංගල්‍ය සඳහා (වයස අවුරුදු දොළහ සම්පූර්ණ වීම නිසා)
    (2) ඔබ මා සෙව්වේ මන්ද, මා පියාණන්ගේ මැඳුරෙහි සිටිය යුතු බව ඔබ නොදන්නෙහිද?
    (3) අතු ගෑම, පිරිසිදු කිරීම, මල් සිටවීම, මල් වලට වතුර දැමීම ........ වැනි ශිෂ්‍ය පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න.

05. (1) ජුදෙව් සිරිතට අනුව මෘත ශරීරය සුවඳ ද්‍රව්‍යයෙන් ආලේප කිරීමට ය.
    (2) 'උන්වහන්සේ මෙහි නැත. උන්වහන්සේ කී ලෙස නැගිටුණු සේක.'
    (3) ජීවිතාදර්ශය, නොදන්නා අයට සුපුවත ප්‍රකාශ කිරීම. .............. වැනි පිළිතුරු වලට ලකුණු දෙන්න.

06. (1) අපගේ පව් වලට මිදීම ලබා දීම සඳහා
    (2) කසයෙන් තැලීම, කෙළ ගැසීම, අපහාස කිරීම.
    (3) සිසුන්ගේ පිළිතුරු සලකා බලා ලකුණු ලබා දෙන්න.

**II කොටස**

1 ප්‍රශ්නයට ලකුණු 2x8 = 16

2 - 6 වන ප්‍රශ්න සඳහා

| | | | |
|---|---|---|---|
| (1) | කොටස | - ලකුණු | 2 |
| (2) | කොටස | - ලකුණු | 3 |
| (3) | කොටස | - ලකුණු | <u>6</u> |
| | | මුළු ලකුණු | <u>11</u> |